1st Place Winner
National Productivity
Award 2020

ISO 9001

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/13/CIR.COM.(3) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.07. 28 |
|---|---|---|---|---|---|

ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
දකුණු පළාත.

**<u>පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාළ කර ගැනීම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ ලිපි අංක 01-17/2025 හා පොදු චක්‍රලේඛ ලිපි අංක 01-22/2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/05/01/30 හා 2025.07.23 දිනැති ලිපිය හා බැඳේ.

02. දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව පහත සඳහන් චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2025.07.15 දිනැති ව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය හා නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|
| 01. | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක - 01-17/2025<br>2025.04.30 | ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටවූ වෛද්‍ය නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| 02. | සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක - 01-22/2025<br>2025.05.07 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතින් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ |

02. ඒ අනුව, එම කාරණය පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

(6)

(1)

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு தென் மாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION, SOUTHERN PROVINCE
දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සංකීර්ණය,6 වන මහල,කළුවැල්ල, ගාල්ල. / மாவட்ட செயலாளர் ஒன்றியம்,6ம் மாடி, களுவெல்ல, காலி. / District Secretariat,6th Floor, Kaluwella, Galle.

මගේ අංකය / எனது இல / My No: SP/PSC/05/01/30

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2025.07. 23

24 JUL 2025

ACS / A

ප්‍රධාන ලේකම්
දකුණු පළාත

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව දකුණු පළාත් සභාව සඳහා චක්‍රලේඛ අදාල කර ගැනීම සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-17/2025 හා පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-22/2025**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක. CSS/3/13/CIR.COM(2) හා 2025.06.19 දිනැතිව මා වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ.

02. එකී ලිපියේ සඳහන් ඉල්ලීම පරිදි දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව පහත සඳහන් චක්‍රලේඛයන්හි විධි විධාන දකුණු පළාතට අදාල කර ගැනීම සඳහා 2025.07.15 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක. GS/SP/EST/1/1/01 හා 2025.07.16 දිනැති ලිපියෙන් මා වෙත දැනුම් දී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. අනුමැතිය සහිත එම චක්‍රලේඛයන්හි සහතික කරන ලද ඡායා පිටපතක් බැගින් මේ සමඟ අමුණා එවමි.

| චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛයේ අංකය හා දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|
| සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-17/2025 හා 2025.04.30 | ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අත්හිටවූ වෛද්‍ය නිලධරයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | පොදු චක්‍රලේඛ ලිපි අංක. 01-22/2025 හා 2025.05.07 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතීන් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ |

සී.පී. රාජකරුණා
ලේකම්
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

දුරකථන / தொலைபேசி / Telephone
සභාපති/தலைவர்/ Chairman : 091-2222497
ලේකම්/செயலாளர்/ Secretary : 091-2233366
සහකාර ලේකම්/உதவி செயலாளர்/Asst.Secretary: 091-2248450
කාර්යාලය/அலுவலகம்/Office : 091-2234309
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091-2228811
ඊ-මේල් / ஈ-மெயில் / e-mail: secretary@psc.spgov.lk

දුරකථන ) 011 2669192, 011 2675011
தொலைபேசி ) 011 2698507, 011 2694033
Telephone ) 011 2675449, 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) එච්පී/ඩීපී/20/2024
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )
Date ) 27/05/2025

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

මුල් පිටපතින් උපුටා ගන්නා ලද පිටපතක් බවට සහතික කරමි

පොදු චක්‍රලේඛ අංක : 01-22/2025

සියළුම අතිරේක ලේකම්වරුන්
සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියළුම විශේෂිත වැඩසටහන් ප්‍රධානීන්
සියළුම සෞඛ්‍ය සත්කාර ආයතන හා රේඛීය අමාත්‍යාංශයේ රෝහල් ප්‍රධානීන්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

## <u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතින් ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ</u>

රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති විවිධ සෞඛ්‍ය සේවා ආයතන මෙන්ම පළාත් සෞඛ්‍ය සේවා ආයතන මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්, ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය වී ඇත. මෙම තත්වය, සෞඛ්‍ය අමාත්‍යාංශයට ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඇගයීම් සිදු කිරීම, වාර්තාකරණය, ද්විකරණය වැළැක්වීම, වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දුෂ්කරතා සහ ව්‍යාපෘති අධීක්ෂණය, ඇගයීම ඇතුළු අභියෝග කිහිපයක් නිර්මාණය කර ඇත.

මෙම සන්දර්භය තුල, ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ වැදගත්කම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති අතර මෙම ගැටළුව විසඳීම සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත. තවද, මෙම මාර්ගෝපදේශ සකස් කිරීමේදී මුදල් අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයෝජන සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට අදාළව නිකුත් කරන ලද පහත සඳහන් ලේඛන දෙක කෙරෙහි අවධානය යොමු කරන ලදී.

I. රාජ්‍ය ආයෝජන සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශ මැයෙන් අංක MNPEA 02/2019 හා 2019.01.10 දිනැති චක්‍රලේඛය

II. 2024 අංක 44 දරණ රාජ්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ පනත යටතේ රාජ්‍ය ආයෝජන සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම මැයෙන් අංක NP/MEP/2024/04 හා 2024.09.12 දිනැති ලිපිය

2025/07/15

*ඕනෑම වර්ගයක අරමුදල් ප්‍රභවයන් යොදාගෙන ව්‍යාපෘති යෝජනාවන් ඉදිරිපත් කිරීමට ඔබ අදහස් කරන්නේ නම් ක්‍රියාවලිය විධිමත් කිරීමට මෙම මාර්ගෝපදේශ වෙත දැඩි ලෙස අනුගත වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.*

1. ව්‍යාපෘති වර්ගීකරණය

(අ) ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය (TEC) අනුව

| ව්‍යාපෘති කාණ්ඩය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රුපියල් මිලියන) |
|---|---|
| මහ පරිමාණ (Mega) | 10,000 වඩා වැඩි |
| විශාල (Large) | 1,000 – 10,000 |
| මධ්‍යම (Medium) | 100 – 1,000 |
| කුඩා (Small) | 10 – 100 |
| ක්ෂුද්‍ර (Micro) | 10 ට වඩා අඩු |

මුල් පිටපතින් උපුටා ගන්නා ලද පිටපතක් බවට සහතික කරමි

ඩබ්ලිව්.එම්. තුෂාරිකා ප්‍රියදර්ශනී
පරිපාලන නිලධාරී

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව ක්ෂුද්‍ර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකි අතර ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව (NPD) විසින් ලබා දී ඇති ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කල යුතුය. යෝජනා පත්‍රයේ ආකෘතිය සහ මාර්ගෝපදේශ NPD වෙබ් අඩවියෙන් බාගත කල හැකිය.

(ආ) අරමුදල් ප්‍රභවය අනුව

- දේශීය අරමුදල් සපයන ව්‍යාපෘති
- ආධාර ප්‍රදාන අරමුදල් (දේශීය / විදේශීය) සපයනු ව්‍යාපෘති
- දේශීය අරමුදල් හා ආධාර ප්‍රදාන අරමුදල් සපයනු ව්‍යාපෘති
- ප්‍රදාන / ණය ආධාර සපයන ව්‍යාපෘති

2. ව්‍යාපෘති ගොඩනැගීම

(අ) නව ව්‍යාපෘති හඳුනාගැනීම සහ අත්හිටවූ ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හෝ නැවත ආරම්භ කිරීම අදාල අංශවල සැබෑ අවශ්‍යතා මත පදනම් විය යුතුය.

(ආ) ව්‍යාපෘති යෝජනාව, අදාල ප්‍රතිපත්ති හෝ උපාය මාර්ගික සැලසුම් සමඟ සමපාත විය යුතුය.

(ඇ) අනුමත රෝහල් සංවර්ධන ප්‍රධාන සැලැස්මට අනුකූලව රෝහල් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. රෝහල් සංවර්ධන ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා කරුණාකර ආයතනික සංවර්ධන ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් 2016.06.17 දිනැති පොදු චක්‍රලේඛ අංක 01 – 35 / 2016 වෙත අවධානය යොමු කරන්න.

(ඈ) ක්ෂුද්‍ර ව්‍යාපෘති හැර, අනෙකුත් සියළුම ව්‍යාපෘති ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) ආකෘති පත්‍රය අනුව ඉදිරිපත් කළ යුතු අතර, NPD මඟින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුගමනය කරමින් එය සම්පූර්ණ කළ යුතුය. ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේදී ඔබට සහය වීමට සහ මඟපෙන්වීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැලසුම් ඒකකය ක්‍රියාත්මකව පවතී.

(ඉ) රෝහල් සංවර්ධන ප්‍රධාන සැලැස්ම, පිඹුරුපත, ගොඩනැගිලි සැලැස්ම, පිරිවැය ඇස්තමේන්තුව, උපාය මාර්ගික සැලැස්ම, විස්තරාත්මක යෝජනාව, ඡායාරූප හා සංඛ්‍යා ලේඛන, ව්‍යාපෘතිය ආධාරයක් /පරිත්‍යාගයක් නම් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය (Letter of Expression of Interest) සහ අවබෝධතා ගිවිසුම් යනාදි අවශ්‍ය උපකාරක ලියකියවිලි යෝජනාවට ඇතුලත් විය යුතුය.

පිටපතක් බවට සහතික කරමි.

ඩබ්ලිව්.එම්. තුෂාරිකා ප්‍රියදර්ශනී
පරිපාලන නිලධාරි
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
දකුණු පළාත

3. සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම

(අ) රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යාපෘති ද ඇතුළුව කුඩා, මධ්‍යම, විශාල, හා මහාපරිමාණ ව්‍යාපෘති සඳහා යෝජනා NPD ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ක්ෂුද්‍ර ව්‍යාපෘති යෝජනාවලට ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස් ඇතුලත් විය යුතු අතර ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සියළුම යෝජනා මූලික ඇගයීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) වෙත ඉදිරිපත් කළ යුතු අතර ඉන්පසු වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඇගයීමේ කමිටුව (PEC) වෙත යොමු කරනු ලබයි.

(ඈ) පළාත් සෞඛ්‍ය සේවා ආයතන නම් යෝජනා (විශාල/මහපරිමාණ), පළාත් සෞඛ්‍ය ලේකම් සහ ප්‍රධාන ලේකම් මගින් පෙරිබිය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

4. ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව (NPD) වෙත ව්‍යාපෘති යෝජනා යොමු කිරීම සම්බන්ධව කටයුතු කිරීමේ කේන්ද්‍රීය ඒකකය ලෙස අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ-සැලසුම් අංශය ක්‍රියා කරයි. අදාළ ක්‍රියාපටිපාටිය පහත සඳහන් වේ.

(අ) ව්‍යාපෘති යෝජනාවක් ලැබුණු පසු ඒවා ඇගයීම සඳහා ව්‍යාපෘති ඇගයීමේ කමිටුව (PEC) වෙත යොමු කිරීමට අධ්‍යක්ෂක - සැලසුම් අංශය කටයුතු කරනු ඇත.

(ආ) PEC මගින් යෝජනාව නිර්දේශ කළ පසු සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය සහිතව NPD වෙත යොමු කරනු ලැබේ.

(ඇ) NPD නිර්දේශ අනුව, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය, අධ්‍යක්ෂක - සැලසුම් අංශය විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ.

(ඈ) එමෙන්ම, ආධාර ප්‍රදාන ව්‍යාපෘති (විදේශීය සහ දේශීය) සඳහා එකඟතා ගිවිසුම් (MoU) අත්සන් කිරීම ද අදාල වන්නේ නම් සම්බන්ධීකරණ කරනු ඇත.

*කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් හෝ තොරතුරු දැන ගැනීම සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක - සැලසුම් අංශය අමතන ලෙස කාරුණිකව දන්වා සිටිමි.*

සෘජු දුරකථන අංකය - 0112 674683
විද්‍යුත් තැපැල - hplanningmdpu@gmail.com

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
පිටපත් :

1. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
2. සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
4. ප්‍රධාන මූල්‍ය නිලධාරි I / II / III
5. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව



01-22/2025
2025/07/15